**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 17කදී මණ්ඩලීය රැස්වීම් හා විධායක කමිටු රැස්වීම් සඳහා ලබාදෙනු ලැබූ රු.2,102,104 ක් වූ අත්තිකාරම් පියවීම ගිණුම්ගත කිරීම සඳහා ජ'නල් වවුචර් හා ජ'නලයක් භාවිතා කර නොතිබුණි. | 2022 වසරේ සිට එම අඩුපාඩුව සකස් කරගනු ලැබේ. | මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන ද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යා යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 07 හි 92(ආ) වගන්තිය ප්‍රකාරව, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගන්නා පිරිවැය රු.1,406,373ක් වූ වත්කම් වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමටද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි. | වත්කම් වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ සඳහා මේ වන විට කමිටුවක් පත්කර ඇත. 2022 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වත්කම් වල සාධාරණ අගය ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුලත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ලද රු.9,524,709 ක් වූ රජයේ ප්‍රදාන වර්ෂයේ ආදායමට ගෙන තිබුණ ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ඊට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂවල ප්‍රතිපාදන ලැබීම් ඉතිරියද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ලැබීම්වල ඉතිරිය ලෙස ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ආපසු ගෙවා තිබූ රු.2,211,706 ක් පරිපාලන වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. | වර්ෂ අවසාන අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවීම ආරම්භ කරන ලද්දේ 2021 වසරේදීය. 2021 ආරම්භක බැංකු ගිණුම් ශේෂයෙහි රු.1,710,066ක පෙර වර්ෂ වල අතිරික්ත මුදල් එකතුවක් පැවතුණි. එබැවින් 2021 වසරේ අවසාන මුදල් ශේෂය ලෙස පෙන්වන රු.2,211,701 වටිනාකමෙහි 2021 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම් වල ඉතිරිය පමණක් නොව පෙර වර්ෂ වල අතිරික්ත මුදල්ද පවතින බැවින් වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම් ගිණුමේ සටහන් කර නොමැත. කෙසේ වෙතත් ගිණුම් සටහන් තැබීමේදී සිදු වී ඇති වරද නිවැරදි කිරීම් කරනු ලැබේ. | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධව ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ප්‍රකාශන තොගය | 1,476,615 | පිටපත් 511 කින් යුතු සඟරා වර්ග 2ක පිරිවැය හා පිටපත් 2966 කින් යුතු ප්‍රකාශන වර්ග 1ක විකුණුම් මිල ඉදිරිපත් නොවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු ප්‍රකාශන තොගයෙහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. | 2014 වර්ෂයට අදාළ කලා සඟරාවේ ඒකක පිරිවැය විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාව කෘතිය ආගමික සේවාවක් මිස විකිණීම සඳහා කරන ලද්දක් නොවේ. එය ප්‍රමුඛ පෙලේ විහාරස්ථාන සඳහා නොමිලයේ බෙදා දෙන බැවින් එහි විකුණුම් මිලක් සඳහන් කර නැත. | අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ | | | |
| | (i) 7(අ), 7(ආ) සහ 11(1) වගන්ති | මණ්ඩලීය සාමාජිකයන් හා විධායක කමිටු සාමාජිකයන් විධිමත් පරිදි පත්කර, පත්වීම්ලිපි ලබා දී නොතිබුණි. | බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි රේඛීය අමාත්‍යාංශය විසින් පත්කිරීම් කර ඇත. මෙම පත්වීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ මැදිහත්වීමක් නොමැත. | පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) (1)10 වගන්තිය | සෑම තුන් මාසයකටම වරක් මණ්ඩලයේ රැස්වීමක් පවත්වනු ලැබිය යුතු වුවත් 2021 වර්ෂය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | 2021 කොරෝනා වසංගතය නිසා මහජනයා ඒකරාශී වන රැස්වීම් ආදිය නොපවත්වන ලෙස සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත්කර තිබුණි. කලා මණ්ඩල රැස්වීම සඳහා වැඩි පිරිසක් සහභාගීවන නිසා රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. මින් ඉදිරියට නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 135 | මණ්ඩලය විසින් 2021 වර්ෂය සඳහා මූල්‍ය බලතල පවරා නොතිබුණි. | ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත මගින් ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ දක්වා ක්‍රියාත්මක වී ඇත. වර්තමානයේ රාජ්‍ය අමාත්‍යාංශයෙන් උපදෙස් ලබාගෙන මු.රෙ.135 ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 445(1) | පුද්ගල වැටුප් ලේඛනයක් පවත්වා නොතිබුණි | පුද්ගල වැටුප් පිළිබඳ සියළු විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර මුදල් රෙගුලාසි 445(1) ප්‍රකාර පුද්ගල වැටුප් ලේඛනයක් පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පුද්ගල වැටුප් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 වැනි දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | | | |
| | (i) 5.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ 2021 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | 2021 වසරේ අයවැය ලේඛනය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති අතර 2022 වසරේ සිට අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ. | අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 4.2.6 ඡේදය | රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වසරේ සිට සිදු කිරීමට කටයුතු කර ඇත. | නියමිත පරිදි වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පොදු 287 ස්ථාවර වත්කම් ලේඛනයට තොරතුරු ඇතුලත් කිරීම ආරම්භ කර ඇත. | ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2(vii) ඡේදය | මණ්ඩලයේ අනුමත තනතුරක් නොවූ ගිණුම් ලිපිකරු තනතුර සඳහා 2012 දෙසැම්බර් 11 දින කොන්ත්‍රාත් පදනම මත සේවකයෙකු බඳවාගෙන සේවා ඛණ්ඩනයක් රහිතව වාර්ෂිකව දීර්ඝ කරමින් පැවතුණි. 2021 වර්ෂය සඳහා මෙම නිලධාරියාට රු.370,000ක දීමනා ගෙවා තිබුණි | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ගිණුම් ලිපිකරුවෙකු ලෙස කටයුතු කර විශ්‍රාම ලබා ගත් නිලධාරියෙක් බඳවා ගැනීමට 2012 වසරේදී කටයුතු කර ඇත. පලපුරුද්ද සහිත පරිණත නිලධාරියෙකු වන මෙම නිලධාරියාගේ සේවය කොන්ත්‍රාත් පදනමින් 2012 වසරේ සිට අඛණ්ඩව වාර්ෂිකව දීර්ඝ කිරීමට හේතු වී ඇත. | තනතුර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,176,242 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 737,820 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,438,422 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන හ ආයතන වියදම් රු. 3,791,240 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත කාලානුරූපව ක්ෂේත්‍රයෙහි සිදුවී ඇති වෙනස්කම් හා අවශ්‍යතාවයන් සලකා සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට පනත සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. සංශෝධනය විය යුතු කරුණු ඇතුලත් කරමින් කෙටුම්පත් වාර්තාවක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. නැවත වරක් වර්තමාන ලේකම්තුමියගෙන් ද ඉල්ලීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | උපදේශක සභාවල ක්‍රියාකාරිත්වය, කාර්යභාරය හා වගකීම සම්බන්ධයෙන් පනතේ පැහැදිලිව සඳහන්ව නොතිබීම හේතුවෙන් මණ්ඩලයේ උපදේශක සභා 11 හි රැස්වීම් සඳහා මණ්ඩලයේ නියෝජනයක් නොවීම, ඒ සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වී තිබීම, උපදේශක සභා රැස්වීම් වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම, රැස්වීම් වලදී ගනු ලැබූ තීරණ හා තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම සහ පවත්වන ලද තරඟ සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබීම යනාදි අවිධිමත් අවස්ථා නිරීක්ෂණය විය. තවද උපදේශක සභාවක සිටිය යුතු අවම හා උපරිම සාමාජිකයන් ගණන පනත මගින් නියම කර නොතිබීම නිසා එක් උපදේශක සභාවක 10ත් 14ත් | උපදේශක සභා වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක කමිටුව දැනුවත් කරන ලෙස දැනුම් දී ඇතත් එම උපදෙස් වලට පටහැනිව එම උපදේශක සභා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරමින් පවතී. අනුමණ්ඩල ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැටළු විෂයභාර අමාත්‍යතුමා වෙත දන්වා ඇත. ඊට අදාළව එතුමා විසින් ශ්‍රී ලංකා කලා මණ්ඩලය හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වන බැවින් මෙම ආයතන වල ක්‍රියාකාරිත්වය පහසුවීම සඳහා ශ්‍රී ලංකා කලා මණ්ඩලයද බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතට පවරාගන්නා ලෙස එම අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. වර්තමානයේ උපදේශක සභා කලා මණ්ඩලයේ උපදෙස් වලට පටහැනිව ක්‍රියාත්මක වන බැවින් පවතින ගැටළු සම්බන්ධව ජ්‍යේෂ්ඨ අමාත්‍යාංශය හා අමාත්‍යතුමා දැනුවත් කර ඇතත් ඒ සඳහා | අවශ්‍යතාවයන් සලකා බලා පනතට සංශෝධනයන් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| අතර ප්‍රමාණයක සාමාජිකයන් ගණනක් වූ අතර උපදේශක සභා රැස්වීම් පැවැත්වීමට අදාල විධිවිධානද පනතේ සඳහන් නොවීම හේතුවෙන් 2021 වර්ෂය තුළ පවත්වන ලද උපදේශක සභා රැස්වීම් ගණන 0ත් 7ත් අතර විය. | පිළිතුරු ලැබී නැත. |